# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1771/21 – 2012 අගෝස්තු 16 වැනි බ්‍රහස්පතින්දා – 2012.08.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොට්ඨාස අංක 03 මාතර මහ නගර සභා සීමාව තුළ එළියකන්ද සුළු කොට්ඨාසයේ කුඩාගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක එම්ආර්/එම්ටීආර්/2011/416 හා 2011.10.24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.7327 ක් පමණ වූ පරගහහේනවත්ත නමැති පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. **කැබලි අක්ෂර 'ඒ' – පරගහහේන වත්ත – ප්‍රමාණය: හෙක්. 0.7327ක් පමණ**

උතුරට: හිමිකම් කියන්නකු ඉදිරිපත් නොවූ පරගහහේන වත්ත, හිමිකම් කියන්නකු ඉදිරිපත් නොවූ පොල් ඉඩම සහ හිමිකම් කියන්නකු ඉදිරිපත් නොවූ බ්‍රවුන්ස්හිල් ලඳු කැළය; නැගෙනහිරට: එල්. ඩී. ඩබ්. සෙනෙවිරත්න හිමිකම් කියන පරගහහේන වත්ත සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ හිමිකම් කියන්නකු නොදන්නා බ්‍රවුන්ස්හිල්; බටහිරට: හිමිකම් කියන්නකු නොදන්නා බ්‍රවුන්ස්හිල්.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය:4/3/4/2011/වයිඑ/242.
2012 ජූලි මස 10 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 879



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.